ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී උපාධි තෙවන වසර ප්‍රථම අර්ධ වාර්ෂික පරීක්ෂණය –2017 ජූලි/අගෝස්තු

ආර්ථික විද්‍යාව

**ECON 3151.03 – රාජ්‍ය ආර්ථික විද්‍යාව**

කාලය : පැය තුනයි (03)

---

ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

---

01. (i) වෙළඳපොළ ආර්ථිකයක ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි)

(ii) වෙළඳපොළ අසාර්ථකවීම් සිදුවන අවස්ථා මොනවාද?

(ලකුණු 08 යි)

02. (i) බාහිරතා (අවශිෂ්ටතා) යන්නෙන් ඔබට වැටහෙන්නේ කුමක්ද?

(ලකුණු 04 යි)

(ii) කිසියම් කර්මාන්තශාලාවක නිෂ්පාදන ක්‍රියාවලිය නිසා ජලාශයක් අපවිත්‍ර වෙතැයි සිතන්න. අපවිත්‍රතා ප්‍රමාණය සමාජය අභිමත මට්ටමේ පවත්වා ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග කවරේදැයි පෙන්වා දෙන්න.

(ලකුණු 12 යි)

03. පහත දක්වෙන දෑ අතුරින් ඕනෑම **හතරක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) රජයේ කාර්යභාරය පිළිබඳ සම්භාව්‍ය ආර්ථික විද්‍යාඥයින්ගේ අදහස්.

(ii) රජයේ කාර්යභාරය පිළිබඳ නව සම්භාව්‍ය ආර්ථික විද්‍යාඥයින්ගේ අදහස.

(iii) රෝල්සියානු ප්‍රාථමික භාණ්ඩ (Rawlsian Primary goods) .

(iv) රජයේ කාර්යභාරය පිළිබඳ බියුකැනන් ( Buchanan) ගේ අදහස්.

(v) රජයේ කාර්යභාරය පිළිබඳ ලෝක බැංකුවේ අදහස්.

(එක් කොටසකට ලකුණු 04 බැගින් ලකුණු 16 යි)

04. (අ) පහත දක්වෙන සංකල්ප සැකෙවින් පැහැදිලි කරන්න.

(i) ශුද්ධ පෞද්ගලික භාණ්ඩ.

(ii) ශුද්ධ පොදු භාණ්ඩ.

(iii) අර්ධ පොදු භාණ්ඩ.

(iv) ශුභසාධන භාණ්ඩ

**(එක් කොටසකට ලකුණු 03 බැගින් ලකුණු 12 යි)**

(ආ) "පොදු භාණ්ඩ සැපයීම රජය විසින් කළ යුතුය". ඔබ මෙම ප්‍රකාශයට එකඟ වන්නෙහිද ? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

**(ලකුණු 04 යි)**

05. (i) රාජ්‍ය පාලනය විමධ්‍යගතකරණය පිළිබඳව ඉදිරිපත්ව ඇති නිර්වචන විවේචනාත්මක විමසන්න.

**(ලකුණු 08 යි)**

(ii) ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලනය විමධ්‍යගතකරණය පිළිබඳ අත්දැකීම් සැකෙවින් පැහැදිලි කරන්න.

**(ලකුණු 08 යි)**

06. (i) රාජ්‍ය වියදම් පිළිබඳ වර්ගීකරණ කවරේද?

**(ලකුණු 06 යි)**

(ii) රාජ්‍ය වියදම්වල ආර්ථික ප්‍රතිවිපාක පැහැදිලි කරන්න.

**(ලකුණු 06 යි)**

(iii) මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ රාජ්‍ය වියදම් වේගයෙන් ඉහළ යාමට බලපා ඇති සාධක පිළිබඳ විමසීමක් කරන්න.

**(ලකුණු 04 යි)**

07. (i) බදු පැනවීමේ අරමුණු මොනවාද?

**(ලකුණු 08 යි)**

(ii) කුමන බදු මූලධර්ම මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා උපකාරී වේද?

**(ලකුණු 08 යි)**

08. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය වඩා කාර්යක්ෂම කිරීම සඳහා ඔබ බදු ප්‍රතිපත්තියෙහි කුමන ආකාරයේ ප්‍රතිශෝධනයන් යෝජනා කරන්නෙහිද?

**(ලකුණු 16 යි)**

09. (i) 'රාජ්‍ය ණය' යන්නෙන් ඔබට වැටහෙන්නේ කුමක්ද?

**(ලකුණු 04 යි)**

(ii) රාජ්‍ය ණය ප්‍රසාරණයක් නිසා ඇතිවිය හැකි ආර්ථික ප්‍රතිවිපාක කවරේද?

**(ලකුණු 12 යි)**

..............